# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**10 ශ්‍රේණිය**

## නාට්‍යය හා රංග කලාව - II

නම/ විභාග අංකයඃ ........................................ කාලය ;- පැය 2යි

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

---

01) දික්තල කාලගෝල නාට්‍ය ඇසුරුකර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මෙම නාට්‍යය මුල්වරට වේදිකාගත කරන ලද්දේ කවදද? කොහේද?
ii. මෙම නාට්‍ය සඳහා සංගීතය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
iii. මෙම නාට්‍ය පෙළ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
iv. එම රචකයා විසින් රචනා කරන ලද තවත් නාට්‍ය දෙකක් ලියන්න.
v. මෙම නාට්‍යයේ ප්‍රධාන ගැටුම කුමක්ද?
vi. එම ගැටුම විසඳෙන්නේ කෙසේද?

(ලකුණු 6x2=12)

02)

i. රංග අභ්‍යාස යනු කුමක්ද? (ල 2)
ii. රංග අභ්‍යාස හතරක් නම් කරන්න. (ල 4)
iii. රංග අභ්‍යාස කිරීමෙන් නළුවකුට ලැබෙන ප්‍රයෝජන පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල 4)

03)

i. කාන්තාවන් වෙනුවෙන් කරන පහතරට ශාන්තිකර්මය කුමක්ද? (ල 2)
ii. එම ශාන්තිකර්මයේ නාට්‍යමය ලක්ෂණ ඇතුළත් පෙළපාළි නම් කරන්න. (ල 4)
iii. ඉන් එක් නාට්‍යමය ලක්ෂණ ඇතුළත් පෙළපාලිමය අවස්ථාවක් පිළිබඳව නාට්‍යමය ලක්සණ සහිතව විස්තර කරන්න. (ල 6)

04)

i. අභිනය යනු කුමක්ද? (ල 2)
ii. අභිනය හතර නම් කරන්න. (ල 4)
iii. වාචික අභිනය ශෛලිය අනුව වෙනස් වන්නේ කෙසේදැයි උදහරණ සහිතව විස්තර කරන්න.(ල 6)

05)

i. නාට්‍යයක් යනු කුමක්ද? යන්නට විද්වතුන් ඉදිරිපත් කර ඇති නිර්වචනයක් ලියන්න. (ල 2)
ii. වේදිකා නාට්‍යයක දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න. (ල 4)
iii. නාට්‍යයක් හා කතන්දරයක් අතර ඇති වෙනස්කම් වෙන වෙනම සංසන්දනය කරමින් වගුගතකර දක්වන්න. (ල 6)

06) 

i. මෙම ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරු නම් කරන්න. (ල 2)

ii. ඔහුගේ නාට්‍ය හතරක් නම් කරන්න. (ල 4)

iii. ඔහුගෙන් නාට්‍ය කලාවට සිදුවූ සේවාව පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල 6)

07) පහත දැක්වෙන කතා සැකිල්ල ඔබ කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න.

තමාගේ දරුවා වන කමල් විභාගයෙන් අසමත් වී ඇති බව අන්තර්ජාලය ඔස්සේ දැනගත් පියා කෝපයෙන් නිවසට පැමිණෙයි. කමල් තම මව සමඟ පියා නිවසට පැමිණෙන තුරු බලා සිටියි.

- නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ල 4)
- සංවාද හා රංග විධාන සහිතව නාට්‍ය පෙළ රචනා කිරීම සඳහා (ල 8)